පරිපාලන අභියාවන විනිශ්චය අධිකාරය
நிருவாக மேன்முறையீடுகள் நியாயசபை
Administrative Appeals Tribunal

කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2022

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

2022 කාර්ය සාධන වාර්තාව

පටුන	පිටුව
1.1 හැඳින්වීම	1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර අරමුණු	1
1.3 ප්‍රධාන කාර්යයන්	
1.4 සංවිධාන සටහන	2
02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම	3
03. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන මූල්‍ය කාර්ය සාධනය	4
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	6
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	7
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	9
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	9
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	9
3.9 විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ආවරණ ලිපිය	10
විගණකාධිපතිගේ වාර්ෂික විගණන වාර්තාව	11
06. මානව සම්පත් පැතිකඩ	18
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	18
6.3 මානව සම්පත් සංවර්ධන	18
07. අනුකූලතා වාර්තාව	19

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

වැය ශීර්ෂ අංක 09

1.1 **හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) ඡේදය යටතේ වූ 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානයන් ප්‍රකාර පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිහිටුවා ඇත.

1.2 **ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු**

1.2.1. දැක්ම

සේවා දායකයන්ගේ වෘත්තීයමය ගැටලුවලට පරිපාලනමය රෙගුලාසිවලට අනුව සාධාරණ ව විසඳුම් ලබා දීම.

1.2.2. මෙහෙවර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ix වැනි පරිච්ඡේදයෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කරමින් රාජ්‍ය නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයක් හෝ නියමයක් පිළිබඳව ගුණාත්මක සහ ස්වාධීන සමාලෝචනයක් සිදුකර පරිපාලනමය සාධාරණත්වය ඉටු කර දීම.

1.3 **ප්‍රධාන කාර්යයන්**

1.3.1 රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයන්ට සහ නියමයන්ට එරෙහිව ගොනු කරනු ලබන අභියාචන විමර්ශනය කර විනිශ්චයන් ලබාදීම


1.3.2. අභියාචන භාර ගැනීම
2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 4 (1) සහ 4(2) අනුව ඉදිරිපත් කළ යුතු ය.

1.3.3 අභියාචනයක් ලද පසු ගන්නා පියවර
එකී පනතේ 5(1) සහ 5(2) ක්‍රියාපරිපාටිය මූලික පියවර ගෙන 6(අ), (ආ), (ඇ), (ඈ) අනුව ක්‍රියා කිරීම

1.3.4 අදාල පනතේ 7 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභියාචනය ලැබී මාස 2 ක් ඇතුළත අවසන් වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

1.3.5 අදාල පනතේ 8(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නඩු විභාගය සිදු කරනු ලබන අතර 8(2) වගන්තියට අනුව එකී තීරණයක් අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය අධිකරණයක යම් නඩුවකදී හෝ නඩු කටයුත්තකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

14 **සංවිධාන සටහන**



පනතේ 2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සභාපතිතුමා ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කරනු ලැබේ.

2022.12.31 දිනට සංයුතිය:

සභාපති ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අනිල් ගුණරත්න මහතා
සාමාජික ජනාධිපති නීතිඥ ඒ.ඥාණදාසන් මහතා
සාමාජික ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ජී.පී.අබේකීර්ති මහතා

ලේකම් කේ.බී.ඩී.එම්.පී.බී.දිසානායක මහතා
සහකාර ලේකම් එම්.රෆීක් ඉස්මායිල් මහතා

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 අභියාචන සම්බන්ධ ප්‍රගතිය - 2022.12.31 දිනට

2022.01.01 දිනට ඉදිරියට ගෙන ආ අභියාචන සංඛ්‍යාව		1015
නැවත කැඳවූ අභියාචන සංඛ්‍යාව	03	
2022 වර්ෂය තුළ ලද අභියාචන සංඛ්‍යාව	249	252
කාලසීමාව තුළ විභාග කිරීමට තිබූ මුළු අභියාචන සංඛ්‍යාව		1,267
කාලසීමාව තුළ ඉල්ලීමට ඉඩදුන් අභියාචන සංඛ්‍යාව (අනුමත)	33	
කාලසීමාව තුළ ඉල්ලා අස්කරගත් අභියාචන සංඛ්‍යාව	26	
නිෂ්ප්‍රභ කළ අභියාචන සංඛ්‍යාව	141	
අභියාචකගේ / රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/ ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඉල්ලීම මත බහා තබන ලද අභියාචන සංඛ්‍යාව	08	
ඒ අනුව මෙම කාලසීමාව තුළ අවසන් කළ අභියාචන සංඛ්‍යාව		208
2022.12.31 දිනට අවසන් නොවූ 2022 වර්ෂයට ගෙන ගිය අභියාචන සංඛ්‍යාව		1,059

2.2 ඉදිරි දැක්ම

(I). රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාව හරහා ඉදිරිපත් කෙරෙන අභියාචන පිළිබඳව මේ වන විටත් ආරම්භකොට පවත්වාගෙන යනු ලබන කටයුතු නොපිරිහෙළා, නොවලහා යථාවත් කිරීම හා තවදුරටත් ඉදිරිපත් කෙරෙන අභියාචන සම්බන්ධයෙන් තත්ත්වාකාරයෙන් කටයුතු කිරීම.

(II) 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව බලාත්මක කරන ලද විගණන කොමිෂන් සභාව මඟින් දෙනු ලබන තීරණයන්ට අදාල අභියාචන පිළිබඳ කටයුතු ද මෙම අධිකාරයට පැවරෙන නමුත් 2002 අංක 4 දරන පනතට ඇතුළත් නොවන කාර්යයක් බැවින් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කිරීම

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්සීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එස්සීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**			-	
-	භාණ්ඩාගාර අග්‍රිම		30,324,000	28,910,000	එස්සීඒ-3
-	තැන්පතු			-	එස්සීඒ-4
-	අත්තිකාරම් ගිණුම් වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		578,600	717,880	එස්සීඒ-5
				-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		30,902,600	29,627,880	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		30,902,600	29,627,880	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		71,960	19,200	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		30,830,640	29,608,680	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
17,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	16,889,273	16,027,986	
14,205,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	13,699,510	12,498,338	එස්සීඒ-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
31,905,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**30,588,783**	**28,526,324**	
	මූලධන වියදම්				

200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	199,750	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	70,930	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එස්සිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
-	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
200,000	**මුළු මූලධන වියදම් (උ)**		**199,750**	**70,930**	
	තැන්පතු ගෙවීම්		-	-	එස්සිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		500,000	1,262,000	එස්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (උෆ)		**500,000**	**1,262,000**	
	මුළු වියදම් එ = (ඊ+උ+උෆ)		**31,288,533**	**29,859,254**	
32,105,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(457,893)	(250,574)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(457,893)	(250,574)	එස්සිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එස්සිඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒඑසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියන හා උපකරණ	ඒඑසිඒ-6	20,721,840	20,522,090
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසිඒ-5/5(ඒ)	1,544,300	1,622,900
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසිඒ-3	-	-
මුළු වත්කම්		22,266,140	22,144,990
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,544,300	1,622,900
දේපළ පිරියත හා උපකරණ සංචිතය		20,721,840	20,522,090
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඑසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒඑසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒඑසිඒ-3	-	-
මුළු වගකීම්		22,266,140	22,144,990

පිටු අංක 07සිට 21දක්වා ඒඑසිඒ 1 සිට ඒඑසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 22සිට 23 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිකාරි
නම්: විශාඛා දුෂ්මන්තිණ්ණගේ විතිසූරු ඇතිල් ගුණරත්න
සභාපති
ජාතික ගණකාධිකාරි දිනය: 2023/02/21

ගණකාධිකාරි
නම්: ඒ. ඩී. එම්. ඒ. ඩී. දිසානායක
ලේඛාධිකාරී
ජාතික ගණකාධිකාරි දිනය: 2023.02.21

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම්: එම්. රහීක් ඉස්මායිල්
සහකාර ලේකම්
දිනය: 2023.02.21

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	445,893	384,474
අග්‍රිම ලැබීම්	30,324,000	28,910,000
අත්තිකාරම් අයකර ගැනීම්	578,600	583,980
නැන්පතු ලැබීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**31,348,493**	**29,878,454**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	30,576,783	28,526,324
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	71,960	19,200
අත්තිකාරම් ගෙවීම්	500,000	1,262,000
නැන්පතු ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**31,148,743**	**29,807,524**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**199,750**	**70,930**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	199,750	70,930
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**199,750**	**70,930**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(199,750)**	**(70,930)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඊ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ')=(ඊ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ')	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් නැත

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය රු.	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.3.9900	වෙනත් ආදායම්	ඇස්තමේන්තු කළ නොහැක.	-	118,520/-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	31,905,000	31,905,000	30,588,783	96%
ප්‍රාග්ධන	200,000	200,000	199,750	100%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - **නැත.**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	20,721,840	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/AAT/2/22/15

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 11 දින.

APPEALS TRIBUNAL SRI LANKA 12 MAY 2023

සභාපති,

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

ශීර්ෂය - 009 පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එච්.එස්.එස්.පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

එච්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/B/AAT/2/22/15. මෙහි අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 11 දින.

සභාපති,

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව බවට සාධාරණ සහතුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 71,960 ක් වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරයට පියවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයක් නොතිබුණද මූල්‍ය ප්‍රකාශන වල ඒසීඒ 3 ආකෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව අග්‍රිම ශේෂය ලෙස රු. 71,960 දක්වා තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 04 ක සියයට 28 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වැය විෂයය 1003 - වෙනත් දීමනා සඳහා මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් ශීර්ෂ විසින් කර තිබූ රු.12,000 ක වියදම අධිකාරය විසින් සිදු කළ වියදමක් ලෙස සලකා ඒසීඒ -2(ii) අකෘතියේ මුදල් පොතට අනුව වියදමට එකතු කර දක්වා තිබුණි.

2.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය	සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ	
(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛය	සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විනාශ කළ යුතු භාණ්ඩ, අලුත්වැඩියා කළ යුතු භාණ්ඩ, විකිණිය යුතු භාණ්ඩ හා වෙනත් රජයේ ආයතන වලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු කටයුතු කර ඊළඟ වර්ෂයේ මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පොදු 47 වාර්තාව අනුව කටයුතු කිරීමකින් තොරව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.
(ii) 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන චක්‍රලේඛයේ 04 ඡේදය	අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
(i) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය	අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ii) 2022 අගෝස්තු 29 දිනැති අංක 02/2021 (vii) දරන චක්‍රලේඛය	ඇඟිලි සළකුණු යන්ත්‍රයෙන් පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවට පැමිණීමේ පිටවීමේ ලේඛනයක් නඩත්තු කිරීම 2021

	ඔක්තෝබර් 02 දින සිට 2022 ජනවාරි 02 දින දක්වා පමණක් විය යුතු බව දන්වා තිබුණද අධිකාරය 2022 ජනවාරි 02 සිට විගණිත දිනය වූ 2023 පෙබරවාරි 06 වන විටත් ඇඟිලි යලකුණු යන්ත්‍රය භාවිතා කිරීම වෙනුවට පැමිණීමේ පිටවීමේ ලේඛනය නඩත්තු කර තිබුණි.
(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) වගන්තිය	සමාලෝචිත වර්ෂයේදී රු.199,750 ක් වැය කර සිදු කර තිබූ කාර්යාලීය අභ්‍යන්තර දුරකථන පද්ධතිය නවීකරණය කිරීමේ ප්‍රසම්පාදන කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

අධිකාරය විසින් 2022 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූල නොවීය.

3.1.2 කාර්යභාරයන් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර පනතේ 7 වන වගන්තිය අනුව අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් එම අභියාචනය ලැබී මාස 2 ක් ඇතුළත විභාග කර අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව සඳහන්ව තිබුණද අධිකාරයට ලැබී තිබූ අභියාචනා වලින් 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 03 ට අඩු විසඳීමට පවතින අභියාචනා 412 ක්ද වර්ෂ 03ට වැඩි වර්ෂ 05 ට අඩු විසඳීමට පවතින අභියාචනා 354 ක් ද හා වර්ෂ 5 ට වැඩි විසඳීමට පවතින අභියාචනා 47ක්ද පැවතුනි.

(ආ) 2022 වර්ෂය තුල අධිකාරය වෙත අභියාචනා 252 ක් ලැබී තිබුණු අතර ඉන් විසඳා අවසන් කර තිබුණේ අභියාචනා 06 ක් පමණි. එය ලැබුණු අභියාචනා වලින් සියයට 2.38 ක් පමණක් විය.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මහජනයාගේ අවශ්‍යතාවය සහ ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවිය මගින් පහසුකම් සලසා තිබිය යුතු වුවත් අධිකාරය විසින් වෙබ් අඩවියක් සකස්කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට අධිකාරයේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 19 ක් වූ හෙයින් කාර්ය මණ්ඩලයේ 12 ක පුරප්පාඩු පැවතුණි. තනතුරු 7 ක් කොන්ත්‍රාත් පදනම මත සම්පූර්ණ කර තිබුණු අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන ලේකම් තනතුර හා සහකාර ලේකම් තනතුර 2017 වර්ෂයේ සිටම කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

5.2 බදවාගැනීමේ පරිපාටි සැකසීම

අධිකාරය පිහිටුවා වසර 20 කට අධික කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් එක් තනතුර සඳහා බදවා ගැනීමේ පරිපාටි සකස් කර නොතිබුණි.

එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
වත්තරමුල්ල

එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක - අදාල නොවේ.

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. - අදාල නොවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	03	02	01
තෘතියික	-	-	-
ද්විතියික	21	12	09
ප්‍රාථමික	08	04	04
එකතුව	32	18	14

6.2 පවතින සීමිත කාර්ය මණ්ඩලයට පුරප්පාඩු ද ආවරණය වන පරිදි ප්‍රායෝගික විෂයෙන් යෝග්‍ය වන ආකාරයට රාජකාරි පවරා ඇති බැවින් අධිකාර කාර්යාලයීය රාජකාරි කටයුතු කෙරෙහි බලපෑමක් සිදු නොවීම.

6.3 මානව සම්පත් සංවර්ධන

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු. '000		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම් / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
*ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැතිවීම හේතුවෙන් මානව සම්පත් පුහුණු කිරීම් කළ නොහැකිව තිබුණි.						

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.2	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල නොවේ.	ඒ සඳහා ලිපිකරු නිලධාරියෙකු යොදවා ඇත.
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (සිඟාස්) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	බැරකම් නොතිබුණි.	බැරකම් ඇතිවුවහොත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (පීඒ එන් 20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල නොවේ	ගණකාධිකාරිවරයෙකු ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් වුවද මෙතෙක් බදවා ගෙන නැත.	සහකාර ලේකම්වරයා ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	විශාල වශයෙන් මිලදී ගැනීම් සිදු නොවේ.	එවැනි සැලැස්මක් ප්‍රායෝගික නොවීම

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණකයෙකු නොමැති නිසා එවැනි සැලසුම් සකස් නොකිරීම	ඉදිරි වර්ෂය සඳහා සැලැස්මක් සකස් කිරීමට අදහස් කරමි.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (එන්බීබී) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**	අදාල නොවේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**	අදාල නොවේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදුකෙට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ.	ගර්හිත කරන ලද භාණ්ඩ නොවීම	ගර්හිත භාණ්ඩ ඇති වුවහොත් මු.රෙ. 772 අනුව කටයුතු කිරීමට අදහස් කරමි.
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	ගර්හිත වාහන නොවීම	අවශ්‍ය වුවහොත් එසේ කිරීමට අදහස් කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	අක්‍රිය බැංකු ගිණුම් නොවීම	අක්‍රිය බැංකු ගිණුම් ඇති නොවීමට කටයුතු කිරීම
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල නොවේ.	කල් ඉකුත් වූ ණය ශේෂ නොවීම	හිඟ ණය ශේෂ වුවහොත් එසේ කටයුතු කිරීම
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවයන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිද කටයුතු කිරීම
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිදි කටයුතු කිරීම
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**	අනුකූල නොවේ.	ආදායම් ගිණුමක් නැත.	
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති එම්වැස්ඩී චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතන පිළිබඳ තොරතුරු වහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /	අනුකූල නොවේ.	වෙබ් අඩවියක් ක්‍රියාත්මක නොවේ.	ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

	චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	පුහුණුවීම් ලබා දී නැත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 5/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්ම කර තිබීම	අනකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගැයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රා.පර.චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 18 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 18 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 18 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 18 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 18 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 18 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 18 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 18 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		